

# කාර්ය සාධන වාර්තාව - 2016

# செயலாற்றுகை அறிக்கை - 2016

# Performance Report - 2016



විශේෂ කාර්යභාර අමාත්‍යාංශය

விசேட பணிப்பொறுப்பு அமைச்சு

Ministry Of Special Assignments

# කාර්යභාරය

- 2015.10.24 දිනැති 1937/36 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් විශේෂ කාර්යභාර අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී.

- 2015.10.28 දින සෙත්සිරිපාය දෙවන අදියරෙහි සය වෙනි මහලෙහි අමාත්‍යාංශය සිය කටයුතු ආරම්භ කරන ලදී.

- 2015.12.18 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අමාත්‍යාංශය වෙත කාර්යයන් හා කර්තව්‍යයන් පවරා දී ඇත.

- ඒ අනුව අමාත්‍යාංශය සඳහා පවරා දී ඇති කාර්යයන් හා කර්තව්‍යයන් පහත පරිදි වේ.

1) ජාතික අවශ්‍යතාවයන් මත ක්‍රියාත්මක කළ යුතු කඩිනමින් අවධානයට යොමු කළ යුතු ක්ෂේත්‍රයන්ට අදාල විශේෂ වැඩසටහන් වලට දායක වීම.

2) අතිගරු ජනාධිපතිතුමා විසින් අවස්ථානුකූලව පවරනු ලබන විශේෂ ව්‍යාපෘති අනිකුත් අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය කිරීම.

3) විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනෙකුත් අමාත්‍යාංශ වලට සහාය වීම සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

4) ආර්ථික කළමණාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ කටයුතු සමායෝජනය කිරීම.

5) සංවර්ධන ක්ෂේත්‍රය සම්බන්ධ පර්යේෂණ කටයුතු සිදු කිරීම.


දැක්ම
'' ප්‍රීතිමත් ජනතාවක් සහිත වූ
සංවර්ධිත ආර්ථිකයක් ''
මෙහෙවර
'' ජාතික අවශ්‍යතා අනුව ප්‍රමුඛතාවය හිමි විය යුතු සුවිශේෂී
වැඩසටහන් හා ව්‍යාපෘති වලදී අවශ්‍ය දායකත්වය සැපයීම,
උපක්‍රමික ප්‍රවේශයන් හරහා සංවර්ධනය වේගවත් කිරීමට දායක
වීම සහ නව දැනුම උත්පාදනය සඳහා උර දීම තුලින් සංස්කෘතික
හා ආගමික වටිනාකම් රාමුවක් තුල සමාජ
ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම''

# සංවර්ධන අභිමතාර්ථයන්

1) කඩිනමින් අවධානයට ලක්විය යුතු ක්ෂේත්‍රයන්හි විශේෂ වැඩසටහන්වලට දායක වීම තුලින් ජාතික අවශ්‍යතාවයන් ඉටු කිරීමට සහාය වීම.

2) අතිගරු ජනාධිපතිතුමා විසින් අවස්ථානුකූලව පවරනු ලබන විශේෂ කාර්යන් අනෙකුත් අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය කිරීම තුළින් මහජනතාවට උපරිම සේවයක් සලසා දීම.

3) සංවර්ධන හා ප්‍රධාන මහජන ගැටලු ඉලක්ක කර ගත් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අනෙකුත් අමාත්‍යාංශ වලට සහාය වීම මඟින් සංවර්ධනය වේගවත් කරලීමට දායක වීම.

4) ආර්ථික කළමණාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ කටයුතු සමායෝජනය කිරීම මඟින් ආර්ථික සංවර්ධනය කඩිනම් කිරීම.

5) සංවර්ධන ක්ෂේත්‍රයේ විවිධ විෂයන්ට අදාලව පර්යේෂණ කටයුතු දිරිමත් කිරීම තුළින් නව දැනුම උත්පාදනය.



රාජ්‍ය සේවා සැපයුම් ප්‍රතිසංස්කරණ



## 01. සංවර්ධන අභිමතාර්ථය

කඩිනමින් අවධානයට ලක්විය යුතු ක්ෂේත්‍රයන්හි විශේෂ වැඩසටහන්වලට දායක වීම තුලින් ජාතික අවශ්‍යතාවයන් ඉටු කිරීමට සහාය වීම.





### අරමුණ

නිශ්චය කරනු ලබන කාල රාමුවක් තුලදී කාලීනව අවධානය යොමු කල යුතු සුවිශේෂි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට දායක වීම.

### ප්‍රධාන කාර්යසාධන දර්ශක

දායකත්වය සපයන ලද විශේෂ වැඩසටහන් සංඛ්‍යාව






### ඉලක්ක

හඳුනා ගන්නා ලද විශේෂ වැඩසටහන් සියල්ල නිශ්චය කරන ලද කාලරාමුව තුල අවසන් කිරීම.

### උපාය මාර්ග

විෂය පථය වඩාත් පැහැදිලි කර ගනිමින් හා විශේෂඥ උපදෙස් භාවිතය තුලින් වැඩසටහන යලි පණ ගැන්වීම.





### වැඩසටහන

රාජ්‍ය සේවා සැපයුම් ප්‍රතිසංස්කරණ වැඩසටහන නිර්මාණය කිරීම.

රාජ්‍ය සේවා සැපයුම් ප්‍රතිසංස්කරණ

# 01. සංවර්ධන අභිමතාර්ථය - ප්‍රගතිය

## කඩිනමින් අවධානයට ලක්විය යුතු ක්ෂේත්‍රයන්හි විශේෂ වැඩසටහන්වලට දායක වීම තුලින් ජාතික අවශ්‍යතාවයන් ඉටු කිරීමට සහාය වීම.

කාලීන වශයෙන් වැදගත් වන හා කඩිනමින් අවධානයට ලක් විය යුතු විවිධ ක්ෂේත්‍ර පිළිබඳ අවධානයට ලක් කර එම ක්ෂේත්‍රයන්හි විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් ජාතික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට සහාය වීම මෙම සංවර්ධන අභිමතාර්ථය තුලින් අරමුණු කරයි.

**වැඩසටහන : රාජ්‍ය සේවා සැපයුම් ප්‍රතිසංස්කරණ වැඩසටහන**

විශේෂයෙන්ම පවත්නා රාජ්‍ය සේවා ව්‍යුහය කාලීන මහජන අවශ්‍යතාවයන්ට මනාව ගැලපෙන හා මහජන ප්‍රතිලාභ ඉහළ නංවන ආකාරයට නවීකරණය කල යුතුය යන්න පිළිබඳ සමාජ කතිකාවතක් බිහි වී ඇත.එම කාලීන අවශ්‍යතාවය හඳුනා ගනිමින් නවීකරණය වූ රාජ්‍ය සේවා සැපයීමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමේ කටයුත්ත සඳහා 2016 වර්ෂයේ දී මෙම අමාත්‍යාංශය විසින් කටයුතු ආරම්භ කරන ලදී.

මෙම රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුලින් පවත්නා නීතිරීති හා ක්‍රියා පරිපාටි සමාලෝචනය කිරීම, ඒවා කාලිනව ගැලපෙන පරිදි වැඩි දියුණු කිරීම, ආයතනික හා කළමණාකරන ව්‍යුහයන් වෙනස් කිරීම, අවශ්‍යතාවයට ගැලපෙන ගුණාත්මකභාවයෙන් යුතු මානව සම්පතක් බිහි කිරිම හා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අපේක්ෂා කරන ලදී.

ඒ අනුව පරිපාලන ප්‍රතිසංස්කරණ සඳහා තිරසර වැඩසටහනක් ආරම්භ කිරීම සම්බන්ධව ගරු විශේෂ කාර්යභාර අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ඒ පිළිබඳව අධ්‍යයනය කර වාර්තාවක් සැපයීමට අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත් කරන ලදී. ගරු විශේෂ කාර්යභාර අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද මෙම අනු කමිටුවේ අනෙක් සාමාජිකයින් වනුයේ ගරු මුදල් අමාත්‍යතුමා සහ ගරු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාය. එම අනු කමිටු වාර්තාවේ කෙටුම්පත සකස් කර ඇති අතර නිර්දේශ ලබා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.



## 02. සංවර්ධන අභිමතාර්ථය

අතිගරු ජනාධිපතිතුමා විසින් අවස්ථානුකුලව පවරනු ලබන විශේෂ කාර්යන් අනෙකුත් අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය කිරීම තුළින් මහජනතාවට උපරිම සේවයක් සලසා දීම.

### අරමුණ

අතිගරු ජනාධිපතිතුමා විසින් වරින් වර පවරනු ලබන විශේෂ කාර්යභාරයන් තීරණය කරනු ලබන නිශ්චිත කාල පරාසයක් තුළ ක්‍රියාවට නැංවීම.

### ප්‍රධාන කාර්යසාධන දර්ශක

අතිගරු ජනාධිපතිතුමා විසින් යොමුකල විශේෂ කාර්යන් සංඛ්‍යාව

### ඉලක්ක

අතිගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍යාංශය වෙත යොමු කල විශේෂ කාර්යන් සියල්ල නිශ්චිත කාල රාමුවක් තුළ සාර්ථකව අවසන් කිරීම.

# 02. සංවර්ධන අභිමතාර්ථය - ප්‍රගතිය

## අතිගරු ජනාධිපතිතුමා විසින් අවස්ථානුකූලව පවරනු ලබන විශේෂ කාර්යන් අනෙකුත් අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය කිරීම තුළින් මහජනතාවට උපරිම සේවයක් සලසා දීම.

අතිගරු ජනාධිපතිතුමා වෙත විවිධ සහන බලාපොරොත්තු වන පාර්ශව විසින් වරින් වර ඉදිරිපත් කරනු ලබන විශේෂ අවධානයකින් යුතුව කඩිනමින් ඉටුකළ යුතු කාර්යයන් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් මෙම අමාත්‍යාංශය වෙත යොමු කරන අතර, එවැනි කාර්යයන් අධ්‍යයනය කර උපායමාර්ගික මැදිහත්වීමක් තුලින් අදාල ගැටළු සඳහා අදාල පාර්ශවයන්ට සහන ලබා දීම මෙම වැඩසටහන හරහා සිදු වේ.මේ යටතේ 2016 වර්ෂය තුල දී සහන අපේක්ෂිත විවිධ තැනැත්තන් හා කණ්ඩායම් 80 ක් වෙතින් අතිගරු ජනාධිපතිතුමන් වෙත ලද ලිපි මෙම අමාත්‍යාංශය වෙත යොමු කරන ලදුව එම සියලුම පාර්ශවයන් සඳහා සහන සැලසීම පිණිස විවිධ ක්‍රියාමාර්ගයන් ගනු ලැබ ඇත.

ජනාධිපති ලේකම් කාර්යාලයේ දැනුම් දීම මත විශේෂ කාර්යයභාර ගරු අමාත්‍යතුමා දේශීය සම්මන්ත්‍රණ, රැස්වීම්, වැඩමුළු ආදිය සඳහා අතිගරු ජනාධිපතිතුමා නියෝජනය කරමින් සහභාගී වේ. 2016 වර්ෂය තුල දී එවැනි ජාතික මට්ටමේ අවස්ථා 30 ක දී ගරු අමාත්‍යතුමා විසින් මේ වන විට අතිගරු ජනාධිපතිතුමා නියෝජනය කර ඇත.




*"සමාජය උදෙසා විද්‍යාව හා තාක්ෂණය" මැයෙන් පැවැත්වුණු සමුළුව සඳහා සහභාගීත්වය*




*දකුණු ආසියාවේ ජල සම්පත් කළමනාකරණය පිළිබඳ කලාපීය සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශක ලෙස සහභාගී වෙමින්*

අතිගරු ජනාධිපතිතුමා හෝ ජනාධිපති ලේකම් කාර්යාලයේ දැනුම් දීම මත විශේෂ කාර්යභාර ගරු අමාත්‍යතුමා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, රැස්වීම් හා සංසදවලට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වන අතර, සහයෝගිතා ගිවිසුම් හරහා ආර්ථික සංවර්ධනය කඩිනම් කිරීම මේ මඟින් සිදු වේ. මේ යටතේ ජනාධිපති ලේකම් කාර්යාලයේ දැනුම් දීම අනුව ගරු අමාත්‍යතුමා අතිගරු ජනාධිපතිතුමා සෘජුවම නියෝජනය කරමින් ජර්මනිය හා ජපානයේ ජාත්‍යන්තර මට්ටමින් අවස්ථා 02 කට සහභාගි වී ඇත.

මෙම වැඩසටහන යටතේ ප්‍රධාන කාර්යසාධක දර්ශක ලෙස හඳුනා ගැනනුයේ අතිගරු ජනාධිපතිතුමා විසින් අවස්ථානුකූලව අමාත්‍යාංශය වෙත යොමු කරන විශේෂ කාර්යයන් සංඛ්‍යාව වන අතර එම සංඛ්‍යාව කලින් නිශ්චය කල නොහැකි අතර අවස්ථාව අනුව තීරණය වේ. එසේ අමාත්‍යාංශය වෙත යොමු වන විශේෂ කාර්යයන් සියල්ල එම කාර්යයේ ස්වභාවය අනුව තීරණය වන නිශ්චිත කාල රාමුව තුල අවසන් කිරීම ඉලක්ක කර ගෙන අමාත්‍යාංශය විසින් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරන ලදී.



*පෝලන්ත රජයේ ඇරයුම මත "ආසියා - ශාන්තිකර දිනය" ප්‍රධාන දේශක ලෙස සහභාගි වෙමින්*



*බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවෙහි පැවති "2016 පූර්ව සාක් සමුළුව" අමතමින්*



*නවීන කාර්මික උද්‍යාන සංකල්පය අධ්‍යයනය කිරීම අරමුණු කරගත් චීන නිල සංචාරය*



*දමිළ ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද "මුත්තමිලා 2016" උත්සවය සඳහා ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වෙමින්*

## 03. සංවර්ධන අභිමතාර්ථය

සංවර්ධන හා මහජන ගැටලු ඉලක්ක කර ගත් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අනෙකුත් අමාත්‍යාංශවලට සහාය වීම මගින් සංවර්ධනය වේගවත් කරලීමට දායක වීම

## අරමුණ

සංවර්ධන හා සුභසාධන පදනම් කර ගත් විශේෂ ව්‍යාපෘති කළමනාකරණය හා ප්‍රතිඵල ප්‍රශස්ථ වීමට, එම ව්‍යාපෘති යෝජනා ඇසුරින් ක්‍රියාත්මක කරවීමට දායක වීම

## ප්‍රධාන කාර්යසාධන දර්ශක

සම්බන්ධීකරණය කරන ලද විශේෂ ව්‍යාපෘති සංඛ්‍යාව

## ඉලක්ක

අමාත්‍ය මණ්ඩලය විසින් පවරනු ලබන ව්‍යාපෘති සංඛ්‍යාව නිශ්චිත කාල වකවානුව තුල නිම කිරීම.






# 03. සංවර්ධන අභිමතාර්ථය - ප්‍රගතිය

## සංවර්ධන හා ප්‍රධාන මහජන ගැටලු ඉලක්ක කර ගත් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අනෙකුත් අමාත්‍යාංශ වලට සහාය වීම මඟින් සංවර්ධනය වේගවත් කරලීමට දායක වීම.

අමාත්‍ය මණ්ඩලය විසින් හඳුනාගන්නා ලද  සංවර්ධන හා ප්‍රධාන මහජන ගැටළු ඉලක්ක කර ගත් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පහත ක්ෂේත්‍රයන්ට අදාලව 2016 වර්ෂයේ දී පිහිටුවන ලද අමාත්‍ය මණ්ඩල අනු කමිටුවල සභාපතීත්වය ගරු විශේෂ කාර්යභාර අමාත්‍යතුමා විසින් දරමින් ජාතික ආර්ථික හා සමාජීය සංවර්ධනයේ ප්‍රගමනය ඉහළ නැංවීම සඳහා සුවිශේෂ මෙහෙවරක් ඉටුකරන ලදී.

1. සහනදායී පොලී අනුපාතයක් මත මධ්‍ය පරිමාණ කෘෂි ව්‍යවසායකයින් සඳහා ගොවි භාරකාර අරමුදලින් ණය ලබා දීම.
2. ඛනිජ තෙල් හා ඛනිජ තෙල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රසම්පාදනය කිරීම.
3. ජාතික විගණන පනත.
4. මහනුවර දිස්ත්‍රික්කය සඳහා ඒකාබද්ධ නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.
5. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් අනුයුක්ත කර ඇති නිලධාරීන් විසින් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනක් ක්‍රියාක්මක කිරීම.
6. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අය විය යුතු මුදල් ගෙවීම.
7. හීලෑ අලි ඇතුන් නියාමනය සහ දැනට විභාග වෙමින් පවත්නා අධිකරණ ක්‍රියාවලිය තුලින් පැන නඟින ගැටළු කෙරෙහි අවධානය යොමු කිරීම.
8. හම්බන්තොට වරාය පිළිබඳ ව්‍යාපෘති යෝජනා.
9. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ චයිනා හාබර් ඉංජිනියරින් සමාගම, සිනෝහයිඩ්‍රෝ සමාගම සමඟ බේරුම්කරණ ක්‍රියාවලිය.

## 04. සංවර්ධන අභිමතාර්ථය

ආර්ථික කළමණාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ කටයුතු සමායෝජනය කිරීම මගින් ආර්ථික සංවර්ධනය කඩිනම් කිරීම.

### අරමුණ

ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් ගනු ලබන තීරණ නිශ්චය කරනු ලබන කාල පරිච්ඡේදයක් තුලදී ක්‍රියාත්මක කිරීමට සහාය වීම.

### ප්‍රධාන කාර්යසාධන දර්ශක

ආර්ථික කළමණාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවට සහභාගි වූ වාර ගණන

### ඉලක්ක

ආර්ථික කළමණාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටු රැස්වීම් කටයුතුවල පැවරෙන කාර්යය සංඛ්‍යාව ඵලදායීව සමායෝජනය කිරීම.

### වැඩසටහන්

මහනුවර මහනගර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සහාය වීම ඇතුළුව ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව මගින් පවරන ලද වැඩසටහන්.

# 04. සංවර්ධන අභිමතාර්ථය - ප්‍රගතිය

## ආර්ථික කළමණාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ කටයුතු සමායෝජනය කිරීම මඟින් ආර්ථික සංවර්ධනය කඩිනම් කිරීම.

ආර්ථික කළමණාකරණය පිළිබඳ තීන්දු තීරණ ගැනීම පිණිස ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආර්ථික කළමණාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව සතිපතා රැස් වේ.

කාලීන සංවර්ධන අවශ්‍යතා මත ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් පහත සඳහන් කාරණා පිළිබඳ පත් කළ අමාත්‍ය මණ්ඩල අනු කමිටු සඳහා ගරු විශේෂ කාර්යභාර අමාත්‍යතුමා සභාපතීත්වය දරමින් ජාතික සංවර්ධන කටයුතු වේගවත් කිරීම සඳහා ප්‍රබල දායකත්වයක් 2016 වර්ෂයේදී ලබා දී ඇත.

1. මහනුවර නගර සංවර්ධන සැලැස්ම.
2. හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සම්බන්ධ සහනදායී ගිවිසුමකට එළඹීම.
3. ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම තුලින් උසස් අධ්‍යාපන පහසුකම් පුළුල් කිරීම.
4. ලංකා විදුලිබල මණ්ඩලය විසින් ස්වාභාවික වායු කර්මාන්තශාලා පිහිටුවීම.
5. සිගරැට් හා දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන මත බදු සංශෝධනය කිරීම.
6. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධ ගැටළු.

7. කාබනික පොහොර නිෂ්පාදනය, ශීතාගාර ස්ථාපිත කිරීමේ හා බලශක්ති ජනනය පිළිබඳ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.

8. නගර සහ ග්‍රාමීය ප්‍රදේශ පවිත්‍රතාවය.

9. මත්තල ගුවන්තොටුපළ ව්‍යාපෘතියට අදාල හිඟ මුදල්.

10. නියං කාලය තුල විදුලි බල සැපයුම.

11. ස්වාභාවික වායු කර්මාන්තශාලා පිරිපහදු සහ සිමෙන්ති කර්මාන්තශාලා ඉදිකිරීම හා ස්ථානගත කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම.

**මහනුවර නගර සංවර්ධන සැලැස්ම**

ඉහත කරුණු අතරින් මහනුවර නගර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ කාර්යභාර අමාත්‍යාංශයේ ඍජු දායකත්වයක් ලබා දෙන ලදී.

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන ගණනාවක් විසින් මහනුවර නගරය සඳහා විවිධ සංවර්ධන සැලසුම් සකස් කරමින් ක්‍රියාත්මක කරනු ලබන අතර, මේ අනුව මහනුවර මහනගර සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරවීමේ දී එම කටයුතු සම්බන්ධීකරණය කර විධිමත් මාර්ගෝපදේශනයක් සැපයීමේ යාන්ත්‍රණයක් තිබීමේ අවශ්‍යතාවය ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේ දී අවධානයට යොමු විය.

ගරු අග්‍රාමාත්‍යතුමාගේ ආරාධනය පරිදි 2016 සැප්තැම්බර් මස ජපානයේ ජයිකා දූත පිරිසක් මහනුවර නගරය නිරීක්ෂණය සඳහා දිවයිනට පැමිණියහ. ඔවුන් මහනුවර නගර සංවර්ධනය සඳහා වන තාක්ෂණික සහාය වැඩසටහනෙහි විෂය පථය නිශ්චය කිරීම කොන්දේසි හා නියමයන් සහ එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙල පිළිබඳ අධ්‍යයනය කිරීම සිදු කරන ලදී.

ලොව සුපතල වාස්තු විද්‍යාඥ කෙරී හිල් විසින් බෝගම්බර හිරගෙදර නවීකරණය සම්බන්ධ මූලික සැලැස්මක් ඉදිරිපත් කර ඇත. එමෙන්ම, සිංහ රෙජිමේන්තුව ප්‍රතිස්ථාපනය කිරීම, නගරාන්තර දුම්රිය සේවාවක් ඇති කිරීම වැනි නව වැඩපිළිවෙලවල් කෙරෙහි අවධානය යොමු වී තිබේ. මෙයට අමතරව විවිධ මූල්‍ය ප්‍රදාන ආයතන මඟින් මහනුවර නගරයේ සංවර්ධනය සඳහා කටයුතු කරනු ලැබේ.

මෙම මහනුවර මහ නගර සංවර්ධන වැඩසටහනෙහි කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් නිර්දේශ කිරීම, මාර්ගෝපදේශ සකස් කිරීම සහ ප්‍රගතිය විමසා බලා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව වෙත වාර්තා කිරීම සඳහා අමාත්‍යවරුන් අට දෙනෙකුගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත් කෙරුණු අතර, එහි සභාපතිතුමා වශයෙන් විශේෂ කාර්යභාර ගරු අමාත්‍යතුමා පත් කරන ලදී.

මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යාලයක් මහනුවර නගරයෙහි ස්ථාපිත කිරීම සහ එයට අවශ්‍ය කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ 2016 වසර සඳහා මෙම අමාත්‍යාංශයට වෙන් වී ඇති ප්‍රතිපාදන මඟින් සපයා දීම, ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව මඟින් නිර්දේශ කරන ලද අතර අමාත්‍ය මණ්ඩලය විසින් මේ සඳහා 2016 නොවැම්බර් මස අනුමැතිය ලබා දී ඇත.

මේ අනුව ගැටඹේ මධ්‍යම පළාත් පුස්තකාල සේවා මණ්ඩලයෙන් මහනුවර මහනගර සංවර්ධන ඒකකය සඳහා කාර්යාල පරිශ්‍ර පහසුකම් ලබා ගන්නා ලදී. මෙම ඒකකය ස්ථාපනය කිරීම සහ කාර්යාල ගෘහ භාණ්ඩ හා උපකරණ සපයා දීම 2016 වර්ෂයේ අමාත්‍යාංශ ප්‍රතිපාදන භාවිතා කරමින් සිදු කරන ලදී.

ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටු තීරණ දිශානති කිරීම හා පසු විපරම් කිරීම සඳහා වූ කමිටුවේ (CCEM – OR) සභාපති ලෙස ගරු අමාත්‍යතුමා 2016 වසර තුල දී ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීමේලා පුරෝගාමිත්වය  දරන ලදී.




# 05. සංවර්ධන අභිමතාර්ථය

සංවර්ධන ක්ෂේත්‍රයේ විවිධ විෂයන්ට අදාලව පර්යේෂණ කටයුතු දිරිමත් කිරීම තුළින් නව දැනුම උත්පාදනය.


## අරමුණ

සංවර්ධන ක්ෂේත්‍රයන්ට අදාල විවිධ පර්යේෂණ යෝජනා තෝරා ගැනිම, අනුමත කිරිම, ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම.



## ප්‍රධාන කාර්යසාධන දර්ශක

අරමුදල් ලබා දුන් පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව



## ඉලක්ක

සමාජ ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රයන්ට අදාලව තෝරා ගත් සියළුම පර්යේෂණ යෝජනා මූල්‍යනය කිරිම.

## උපාය මාර්ග

ප්‍රායෝගික හා න්‍යායාත්මක විශේෂඥ දැනුම එක් කරන දෙමුහුන් යාන්ත්‍රණයක් තුළින් සංවර්ධන පර්යේෂණ කටයුතු සිදු කිරීම.

පර්යේෂණ කටයුතු සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන අතරම පර්යේෂකයන් සඳහා මූල්‍ය ප්‍රතිලාභ මෙන්ම වෘත්තීය පිළිගැනීමක් ලබා දීම.

## වැඩසටහන

සංවර්ධන ක්ෂේත්‍රයන්ට අදාලව පර්යේෂණ කිරිම.

# 05. සංවර්ධන අභිමතාර්ථය - ප්‍රගතිය

## සංවර්ධන ක්ෂේත්‍රයේ විවිධ විෂයන්ට අදාලව පර්යේෂණ කටයුතු දිරිමත් කිරීම තුළින් නව දැනුම උත්පාදනය.

රටක සංවර්ධනයෙහි ලා පර්යේෂණ හා සංවර්ධන අංශයේ (Research and Development) දායකත්වය ඉතා වැදගත්ය. දැනුම පදනම් කරගත් ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම තුලින් ලෝක ආර්ථිකය තුල මෙරටට වඩා ප්‍රතිලාභී උපක්‍රමික ස්ථානයක් (Strategic Position) කරා ළඟා වීමට හැකිය.

කෙසේ වුව ද,රාජ්‍ය අංශය තුල සංවර්ධන පර්යේෂණ කටයුතු සඳහා පවතින්නේ අඩු නැඹුරුතාවයකි. රාජ්‍ය අංශයේ නිලධාරීන් සතුව ආර්ථික සංවර්ධනයට බාධා ඇති කරවන බිම් මට්ටමේ සිට ඉහළ දක්වා විහිදුණු ගැටළු පිළිබඳ මෙන්ම විවිධ ක්ෂේත්‍රයන්හි වර්ධනය කළ යුතු අංශ පිළිබඳ තම පරිචය හරහා ලබා ගත් මනා දැනුමක් හා අවබෝධයක් ඇත. පර්යේෂණ ක්ෂේත්‍රයේ විශේෂඥයින් සතුව පර්යේෂණ සිදු කිරීම සම්බන්ධව අවශ්‍ය කරන න්‍යායාත්මක දැනුම ඇත. මෙම ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම එක් කරන දෙමුහුන් යාන්ත්‍රණයක් බිහිකිරීම තුලින් නව දැනුම සොයායන්නන්ට පහසුකම් සැලසීමත්, රාජ්‍ය සේවය තුල පර්යේෂණ සංස්කෘතියක් බිහි කිරීමත්, ඒ මඟින් වඩාත් පුළුල් පදනමක් මත ලබා ගත් තොරතුරු මඟින් සංවර්ධන තීරණ ගැනීම නිසා ආර්ථික සංවර්ධනයේ වේගවත් බව ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. එමෙන්ම මෙහි දී ජනිත වන නව දැනුම ආර්ථික සංවර්ධනය කරා යොදා ගැනීම තුලින් පොදුවේ මහජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවෙන අතර, ඔවුන් සමාජීය හා ආර්ථික වශයෙන් බලායනය වේ.

සමාජ ආර්ථික සංවර්ධනයට දායක වන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ යෝජනා කැඳවමින් 2016.06.20 දින සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත චක්‍ර ලේඛණයක් නිකුත් ලද අතර එයට ප්‍රතිචාරීව පර්යේෂණ යෝජනා 60 ක් අමාත්‍යාංශය වෙත ලැබිණි. එම පර්යේෂණ යෝජනා වල මූලික කාරණා පිළිබඳ සලකා බලා ව්‍යාපෘති යෝජනා 28 ක් තවදුරටත් සලකා බැලීම සඳහා තෝරා ගන්නා ලදී.

මෙම ක්‍රියාවලියේදී පර්යේෂණ යෝජනා ඉදිරිපත් කරනු ලබන නිලධාරියා අයත් අමාත්‍යාංශයේ ලේකම් විසින් පිහිටුවා ගනු ලබන පර්යේෂණ හා සංවර්ධන කමිටුවක නිර්දේශ මත එකී පර්යේෂණ යෝජනාවන් විශේෂ කාර්යභාර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. එකී පර්යේෂණ යෝජනා ඇගයීම හා උපදේශ හා නිර්දේශ නිකුත් කිරීම අමාත්‍යාංශ පර්යේෂණ යෝජනා ඇගයීම් හා අධීක්ෂණ කමිටුව විසින් සිදු කරන ලදී.

මෙම ක්‍රියාවලිය විද්‍යාත්මක පදනමකින් සිදු කිරීම පිණිස පර්යේෂණ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආකෘතිපත්‍රයක්ද එම ආකෘතිපත්‍රය සම්පූර්ණ කිරීම සඳහා සහ ක්‍රියාවලි පාලනය කිරීම සඳහා වූ උපදෙස් මාලාවක්ද යන දෙඅංශයෙන් යුතු පර්යේෂණ යෝජනා ඉදිරිපත් කිරිම සඳහා වූ මාර්ගෝපදේශනයක්ද, ඒ මත පදනම්ව ඉදිරිපත් කෙරෙන පර්යේෂණ යෝජනා ඇගයීමේ රාමුවක්ද අමාත්‍යාංශය විසින් පිලියෙල කොට භාවිතයට නිකුත් කරන ලදී.

මෙසේ පර්යේෂණ යෝජනා ඇගයීම් හා අධීක්ෂණ කමිටුව විසින් මූලික වශයෙන් ඇගයීමට ලක් කල, තවදුරටත් පරීක්ෂාවට ලක් කර තෝරා ගත් පර්යේෂණයෝජනා 2017 වර්ෂය තුල දී මූල්‍යනය කිරීමට නියමිතය.

# ඇගයීමට ලක් කල පර්යේෂණ යෝජනා

| No. | Name of the Research |
|---|---|
| 01. | Impact of women participation as skilled craftsmen in construction industry |
| 02. | Improvement of income level of beneficiary households through introduction of a self-employment scheme in Horana Relocation Project |
| 03. | Identify current TVET sector-Industry linkage in Sri Lanka & Developing mechanisms to improve these |
| 04. | Compilation of a database depicting the locality differences of Sri Lankan gem varieties with the aid of modern analytical instruments |
| 05. | Genetic analysis of biochemical compounds of Tea (camelia sinensis L) using segregating population |
| 06. | Developing cost effective spray schedules for managing blister blight in tea in order to minimize its effect on cost of production |
| 07. | Feasibility Assessment of Ecotourism in Rubber Plantation Sector in Sri Lanka |
| 08. | Evaluation of the effectiveness of alternative weed control methods and develop economically viable site specific weed management protocol for rubber plantations. |
| 09. | Production of biofilmed biofertilizer to improve soil fertility & fertilizer use efficiency in non-traditional rubber growing areas |
| 10. | Low cost Solar-Biomass hybrid drying system for drying of natural rubber. |
| 11. | An inquiry into the Magnitude & Nature of Time Use among Public Sector Employees. |
| 12. | Reform of the Private Transport sector in Sri Lanka |
| 13. | Remittances to Sri Lanka : What Do We Know ? |
| 14. | Prevalence of fatigue among commercial pilots & the relationship between fatigue & the health issues |


# ඇගයීමට ලක් කල පර්යේෂණ යෝජනා

| No. | Name of the Research |
|---|---|
| 15. | Synthesis of Hydrophobic Silica aerogel using Sri Lankan Vein Quarts ( Research done with Sri Lanka Institute of Nano Technology) |
| 16. | Factors affecting business success of small & medium enterprises in Mahaweli areas |
| 17. | The role of Sri Lanka Missions abroad to contribute for the economic development of Sri Lanka through improvement of trade, tourism & investment. |
| 18. | Training Institute for Sri Lankan migrant workers in Lebanon with a view to enhance the social economic benefit to SL by improving their skills, attitudes & productivity. |
| 19. | Micro Financing: Does it serve for the betterment of the rural farmers? |
| 20. | Identification of Private-Private entrepreneur Partnership model to utilize un-employing professionals to develop diary sector in Sri Lanka |
| 21. | Anthracycline induced cardiotoxicity: A clinical ethnopharmacological & biochemical approach. |
| 22. | Relationship between body composition, anthropometric indices & risk factors for the metabolic syndrome & complications in childhood obesity |
| 23. | Comprehensive analysis on the impact of rubber cultivation on rural livelihood in the Eastern Province of Sri Lanka |
| 24. | Development of an Epidemic Surveillance System for the Analysis & Prediction of Dengue Fever Outbreaks |
| 25. | Cord blood creatine phosphokinase (CPK) activity: A guide to diagnose congenital hypothyroidism (CHT). |
| 26. | Economic Building Operations through low energy practices. |
| 27. | Establishing Interventions to promote zero air quality related health issues in urban environments & Buildings |
| 28. | Job satisfaction of Police officers in Colombo |

# කාර්ය මණ්ඩල තොරතුරු

| අනු අංකය | තනතුර | අනුමත | 2016.12.31 දිනට සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 01. | ලේකම් | 01 | 01 | - |
| 02. | අතිරේක ලේකම් | 01 | 01 | - |
| 03. | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | 01 | - | 01 |
| 04. | ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | - |
| 05. | සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | 01 | - | 01 |
| 06. | සහකාර ලේකම් | 01 | 01 | - |
| 07. | ගණකාධිකාරී | 01 | - | 01 |
| 08. | අභ්‍යන්තර විගණක | 01 | 01 | - |
| 09. | පරිපාලන නිලධාරී | 01 | - | 01 |
| 10. | භාෂා පරිවර්තක (සිංහල / ඉංග්‍රිසි) | 01 | - | 01 |
| 11. | ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | 01 | 01 | - |
| 12. | සංවර්ධන නිලධාරී | 07 | 04 | 03 |
| 13. | රාජ්‍ය කළමනාකරණ සහකාර | 08 | 04 | 04 |
| 14. | රියදුරු | 05 | 05 | - |
| 15. | කාර්යාල කාර්ය සහයක | 08 | 08 | - |
| 16. | වීඩියෝ කැමරා ශිල්පී | 01 | - | 01 |
| 17. | කැමරා ශිල්පී | 01 | - | 01 |
| 18. | කැමරා සහායක | 01 | 01 | - |
| | එකතුව | **42** | **28** | **14** |

# සංවිධාන සටහන


ලේකම්
ප්‍රධාන ගණකාධිකාරී
අතිරේක ලේකම්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ගණකාධිකාරී
භාෂා පරිවර්තක II / I
සහකාර ලේකම්
සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)
ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්
අභ්‍යන්තර විගණක
පරිපාලන නිලධාරී
සංවර්ධන නිලධාරී (02)
රාජ්‍ය කළමනාකරණ සහකාර (03)
සංවර්ධන නිලධාරී (03)
රාජ්‍ය කළමනාකරණ සහකාර (03)
සංවර්ධන නිලධාරී (02)
රාජ්‍ය කළමනාකරණ සහකාර (01)
රාජ්‍ය කළමනාකරණ සහකාර (01)
කාර්යාල කාර්යය සහායක (02)
කාර්යාල කාර්යය සහායක (04)
වීඩියෝ කැමරා ශිල්පී (01)
කැමරා ශිල්පී සහයක (01)
රියදුරු (05)
කැමරා ශිල්පී (01)
කාර්යාල කාර්යය සහයක (02)

# මූල්‍ය කාර්යසාධනය -31.12.2016 දිනට

## ශීර්ෂය - 167 විශේෂ කාර්යභාර අමාත්‍යාංශය

## 01 –මෙහෙයුම් වැඩසටහන

## 01 – අමාත්‍ය කාර්යාලය

රු 000

| විස්තරය | වැය ශීර්ෂය | 2016 අයවැය | 2016 ප්‍රතිශෝධිත අයවැය | 2016.12.31 දිනට සත්‍ය වියදම | ඉතිරි ප්‍රතිපාදන | මුළු වියදමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| වැටුප් හා වේතන | 1001 | 4,250 | 7,250 | 6,780 | 470 | 94 % |
| අතිකාල හා නිවාඩු | 1002 | 1,750 | 1,750 | 1,749 | 1 | 100 % |
| වෙනත් දීමනා | 1003 | 4,100 | 4,950 | 4,930 | 20 | 100 % |
| දේශීය | 1101 | 500 | 500 | 499 | - | 100 % |
| විදේශීය | 1102 | 3,000 | 3,000 | 3,301 | 99 | 97 % |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1201 | 750 | 1,700 | 1,651 | 49 | 97 % |
| ඉන්ධන | 1202 | 4,000 | 4,000 | 3,696 | 652 | 85 % |
| ආහාර පාන හා නිල ඇඳුම් | 1203 | 50 | 350 | 218 | 132 | 62 % |
| වාහන | 1301 | 1,500 | 1,500 | 598 | 502 | 54 % |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1302 | 300 | 50 | 0 | 50 | - |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1303 | 100 | 50 | 0 | 50 | - |
| ප්‍රවාහන | 1401 | 1,800 | 1,350 | 1,215 | 135 | 90 % |
| තැපැල් හා සන්නිවේදන | 1402 | 1,300 | 1,300 | 1,001 | 299 | 77 % |
| විදුලිය හා ජලය | 1403 | 1,000 | 50 | 7 | 43 | 15 % |
| වෙනත් | 1405 | 500 | 500 | 86 | 65 | 57 % |
| **මූලධන වියදම්** | | | | | | |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2001 | 300 | 300 | 0 | 300 | - |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2002 | 100 | 100 | 100 | - | 100 % |
| වාහන | 2003 | 1,200 | 1,200 | 1,200 | - | 100 % |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 2102 | 2,000 | 2,000 | 211 | 1,789 | 11 % |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2103 | 1,500 | 1,500 | 1,500 | - | 100 % |
| වාහන | 2101 | 0 | 43,000 | 32 | 42,968 | 0.1 % |

## ශිර්ෂය - 167 විශේෂ කාර්යභාර අමාත්‍යාංශය
## 01 –මෙහෙයුම් වැඩසටහන
## 02- ආයතන හා පරිපාලන සේවා

රු. 000

| විස්තරය | වැය ශිර්ෂය | 2016 අයවැය | 2016 ප්‍රතිශෝධිත අයවැය | 2016.12.31 දිනට සත්‍ය වියදම | ඉතිරි ප්‍රතිපාදන | මුළු වියදමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | | | |
| වැටුප් හා වේතන | 1001 | 9,500 | 6,500 | 6,148 | 352 | 95 % |
| අතිකාල හා නිවාඩු | 1002 | 1,500 | 1,500 | 580 | 920 | 39 % |
| වෙනත් දීමනා | 1003 | 12,500 | 11,650 | 6,051 | 5,599 | 52 % |
| දේශිය | 1101 | 250 | 250 | 172 | 78 | 69 % |
| විදේශිය | 1102 | 1,000 | 1,000 | 0 | 1,000 | - |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1201 | 500 | 500 | 499 | 1 | 99 % |
| ඉන්ධන | 1202 | 2,500 | 2,500 | 1,303 | 1,197 | 52 % |
| ආහාර පාන හා නිල ඇදුම් | 1203 | 250 | 250 | 86 | 164 | 34 % |
| වාහන | 1301 | 3,000 | 3,000 | 355 | 2,645 | 12 % |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1302 | 800 | 800 | 171 | 629 | 21 % |
| ප්‍රවාහන | 1401 | 150 | 600 | 675 | 75 | 90 % |
| තැපැල් හා සංනිවේදන | 1402 | 2,000 | 2,000 | 1,677 | 323 | 84 % |
| විදුලිය හා ජලය | 1403 | 5,000 | 5,000 | 1,548 | 3,452 | 31 % |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1404 | 15,000 | 15,000 | 14,087 | 1,248 | 92 % |
| වෙනත් | 1405 | 6,000 | 6,000 | 513 | 5,002 | 9 % |
| දේපළ ණය පොලී | 1506 | 350 | 350 | 56 | 294 | 16 % |
| මූලධන වියදම් | | | | | | |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් | 2001 | 200 | 200 | 0 | 200 | - |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2002 | 300 | 300 | 197 | 103 | 66 % |
| වාහන | 2003 | 5,000 | 5,000 | 1,560 | 3,440 | 31 % |
| ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 2102 | 1,500 | 1,500 | 1,010 | 490 | 67 % |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2103 | 2,000 | 2,000 | 1,809 | 191 | 90 % |
| කාර්යය මණ්ඩල පුහුණු | 2401 | 700 | 700 | 316 | 384 | 45 % |
| ආයෝජන | 2502 | 50,000 | 50,000 | 4,502 | 45,498 | 9 % |

# කාර්යමණ්ඩලය සඳහා ලබා දුන් පුහුණු අවස්ථා

| අංකය | පාඨමාලාව පැවැත්වූ ආයතනය | පාඨමාලාවේ නම | නිලධාරී කාණ්ඩය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | දින ගණන |
|---|---|---|---|---|---|
| 01. | නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | බඳවාගැනීම් පරිපාටිය | රා.කළ.සහකාර<br>සංවර්ධන නිලධාරී | 02 | 02 |
| 02. | ඵලදායිතා ලේකම් කාර්යාලය | කයිසෙන් කළමනාකරණය | සංවර්ධන නිලධාරී | 01 | 01 |
| 03. | ඵලදායිතා ලේකම් කාර්යාලය | මූලික ඵලදායිතා සංකල්ප | කාර්යාල සේවක සේවය | 02 | 01 |
| 04. | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ලිපිගොනුකරණය | රා.කළ.සහකාර<br>සංවර්ධන නිලධාරී | 02 | 01 |
| 05. | PRAG SERVICE | මූලික බඳුකරණය | රා.කළ.සහකාර | 01 | 01 |
| 06. | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | අභ්‍යන්තර විගණනය හා අභ්‍යන්තර පාලනය | අභ්‍යන්තර විගණක | 01 | 01 |
| 07. | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ලිපිගොනුකරණය | සංවර්ධන නිලධාරී | 01 | 01 |
| 08. | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ගිණුම්කරණ කාර්යභාරය | රා.කළ.සහකාර<br>සංවර්ධන නිලධාරී | 02<br>01 | 01 |
| 09. | නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | කාර්යාල කළමනාකරණය හා කාර්යාල ක්‍රමවේද | රා.කළ.සහකාර<br>සංවර්ධන නිලධාරී | 02 | 02 |
| 10. | නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | භාණ්ඩ ප්‍රසම්පාදනය සහ ඇගයීම | රා.කළ.සහකාර<br>සංවර්ධන නිලධාරී | 02 | 02 |
| 11. | දුරස්ථ අධ්‍යයන මධ්‍යස්ථානය | ප්‍රතිඵල පාදක කරගත් කළමණාකරණය | අභ්‍යන්තර විගණක | 01 | 02 |

# කාර්ය මණ්ඩලය සඳහා ලබා දුන් පුහුණු අවස්ථා

| අංකය | පාඨමාලාව පැවැත්වූ ආයතනය | පාඨමාලාවේ නම | නිලධාරී කාණ්ඩය | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව | දින ගණන |
|---|---|---|---|---|---|
| 12 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ප්‍රසම්පාදන පුහුණු වැඩමුළුව | සංවර්ධන නිලධාරී | 01 | 02 |
| 13. | නිපුනතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | අභ්‍යන්තර විගණන කාර්ය සාධක පුහුණු වැඩසටහන | අභ්‍යන්තර විගණක | 01 | 02 |
| 14. | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායි ආකාරයෙන් පවත්වාගෙන යාම | රා.කළ.සහකාර | 02 | 01 |
| | | | සංවර්ධන නිලධාරී | | |
| 15 | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | ඵලදායිතා මෙවලම් සහ ශිල්පක්‍රම | රා.කළ.සහකාර | 02 | 06 |
| | | | සංවර්ධන නිලධාරී | 01 | |
| 16 | Adams Skills Development Center | Microsoft Excel පුහුණු පාඨමාලාව | රා.කළ.සහකාර | 01 | 02 |